1. වදන් සැකසුම් මෘදුකාංගයකින් නිර්මාණය කරන ලද වගුවකට අදාළ පහත වගන්ති සලකන්න. (2016)

A - වගුවක අඩංගු පාඨ හැඩසවි ගැන්විය හැක.

B - වගුවක තීරුවක් තුළ අඩංගු වචන ආකාරාදි පිළිවෙළට සකස් කළ හැකි ය.

C -වගුවක තීරුවක් තුළ අඩංගු සංඛ්‍යා එකට එකතු කළ හැකි ය.

ඉහත කුමක් නිවැරදි වේ ද?


1) A හා B පමණි  3) B හා C පමණි

2) A හා C පමණි  4) A, B, C සියල්ලම

2. පහත සඳහන් අංග (features) අතුරෙන් වදන් සැකසුම් මෘදුකාංග හා විද්‍යුත් සමර්පන මෘදුකාංග යන දෙකටම පොදු නොවන අංගය කුමක් ද? (2016)

1) වචන සොයා ප්‍රතිස්ථාපනය කිරීම (Find and Replace)
2) තැපැල් මුසුව (Mail Merge)
3) පේළි අතර පරතරය වෙනස් කිරීම
4) අක්ෂර වින්‍යාසය හරි වැරදි බැලීම

3. පහත P, Q, R හා S ලෙස ලේබල් කර ඇති නිරූපක හතර, ලේඛනයක ඇති පාඨ (text) එකෙල්ල (align) කිරීම සඳහා වදන් සැකසුම් මෘදුකාංග වල සාමාන්‍ය වශයෙන් භාවිත කරනු ලැබේ. (2017)




පහත දක්වා ඇති වගන්ති සලකා බලන්න.

A – P මගින් පාඨ වමට එකෙල්ල කරන අතර, R මගින් පාඨ දකුණට එකෙල්ල කරනු ලබයි.

B – P මගින් පාඨ වමට එකෙල්ල කරන අතර, S මගින් පාඨ දකුණට පමණක් එකෙල්ල කරනු ලබයි.

C – Q මගින් පාඨ මැදට එකෙල්ල කරන අතර, S මගින් පාඨ වමට හා දකුණට යන දෙපසටම එකෙල්ල (Justify) කරනු ලබයි.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ,

1) A හා B පමණි.  3) B හා C පමණි.

2) A හා C පමණි.  4) A, B හා C සියල්ලම ය.

4. වදන් සැකසුම් මෘදුකාංග වල සාමාන්‍යයෙන් භාවිත වන කෙටි මං යතුරු සම්බන්ධව පහත දක්වා ඇති වගන්ති සලකා බලන්න. (2017)

A – Ctrl + C යන්න පාඨ/වස්තු කොපි කිරීම (Copy) සඳහා භාවිත කරයි.

B – Ctrl + A යන්න ලේඛනයක ඇති සියලු පාඨ/වස්තු තේරීම (Select) සඳහා භාවිතා කරයි.

C – Ctrl + V යන්න කොපි කරන ලද පාඨ/වස්තු ඇලවීම (Paste) සඳහා භාවිතා කරයි.

ඉහත කුමන වගන්ති නිවැරදි වේ ද?

1) A හා B පමණි.  3) B හා C පමණි.

2) A හා C පමණි.  4) A, B හා C සියල්ල ම

5. වදන් සැකසුම් ලේඛනයක ඇති හිස් වගුවකට පහත කුමන දෑ කළ හැකි ද? (2018)

A - වගුවේ කෝෂ වර්ණ ගැන්වීම.

B - වගුවේ යාබද කෝෂ ඒකාබද්ධ (සංයුක්ත) කිරීම.

C -වගුවට කෝෂ ඇතුළත් කිරීම.

1) A හා B පමණි.  3) B හා C පමණි.

2) A හා C පමණි.  4) A, B හා C සියල්ල ම

6. වදන් සැකසූ ලේඛනයක වූ දෙන ලද වදනක් සෙවීම සඳහා භාවිත කළ හැකි වන්නේ පහත පෙන්වා ඇති කුමන මෙවලම ද? (2018)

1)   2)   3) 

4) 


ICT Tutorials HUB

7. වදන් සකසන මෘදුකාංගයක ඇති තැපැල් මුසුව (mail merge) පහසුකම භාවිත කර ආරාධිතයන් ලැයිස්තුවකට ආරාධනාපත් මුද්‍රණය කිරීම සඳහා වන පහත පියවර සලකා බලන්න. (2018)

A - ආරාධනා ලිපිය .........P............ ලෙස තැනීම.
B - ආරාධිතයන්ගේ ලැයිස්තුව ලිපිනයන් සමග තනාගෙන ..............Q.......... ලෙස සුරැකීම.
C - තැපැල් මුසු පහසුකම භාවිතා කර .......Q ට අනුව අදාළ තොරතුරු ......P........ ට ඇතුළත් කරමින් ආරාධනා පත් මුද්‍රණය කර ගැනීම.

ඉහත වගන්ති වල ඇති හිස්තැන් පිරවීම සඳහා P හා Q ලේබලවලට අදාළ ගැළපෙන පද යුගලය පිළිවෙළින් සඳහන් වන්නේ කවරක ද?
1) දත්ත මූලය (Data Source), ප්‍රධාන ලේඛනය (Master document)
2) ප්‍රධාන ලේඛනය, දත්ත මූලය
3) ප්‍රධාන ලේඛනය, ශබ්ද නිධිය (Thesaurus)
4) ශබ්ද නිධිය, ප්‍රධාන ලේඛනය

8. වදන් සකසන මෘදුකාංගයක් භාවිත කරමින් ලේඛනයක් සංස්කරණය කරමින් සිටින අතරතුර දී, එම ලේඛනයේ තෝරාගත් කොටසක් වෙනත් ලේඛනයකට පිටපත් කිරීමට ඔබ අදහස් කරයි. මෙම කාර්යය සඳහා පහත සඳහන් කුමන යතුරු සංයෝජනය ඔබ භාවිත කළ යුතු වන්නේ ද? (2019)
1) Ctrl + C අනතුරුව Ctrl + V
2) Ctrl + N අනතුරුව Ctrl + V
3) Ctrl + P අනතුරුව Ctrl + V
4) Ctrl + V අනතුරුව Ctrl + C




9. වදන් සැකසුම් හා ඉලෙක්ට්‍රොනික සමර්පන යන මෘදුකාංග වර්ග දෙකෙහිම පොදු ගුණාංගයක් නොවන්නේ පහත කවරක් ද? (2019)
1) පේළි අතර පරතරය වෙනස් කිරීම.
2) සෙවීම හා ප්‍රතිස්ථාපනය (Find and Replace)
3) තැපැල් මුසුව (Mail Merge)
4) අක්ෂර වින්‍යාස පරීක්ෂාව (Spell checker)

10. මයික්‍රොසොෆ්ට් වර්ඩ් සහ ලිබ්රේ ඔෆිස් රයිටර් භාවිත කර සැකසූ නිසි පරිදි හැඩසවිගන්වන ලද (Formatted) ලේඛන එකතුවක් සමන් සතුව පවතී. සෝදුපත් කියවීම සඳහා ඔහුට මෙම ලේඛන කිසිදු හැඩසවිගැන්වීමක් නොමැතිව සුරැකීමට අවශ්‍යව ඇත. මෙම කාර්යය සඳහා වඩාත් යෝග්‍යතම ගොනු දිගු ප්‍රරූපය (File extension) කුමක් ද? (2020)
1) .odt
2) .txt
3) .docx
4) .pdf

11. වදන් සෙවීම සහ ප්‍රතිස්ථාපනය (Find and Replace) සඳහා මයික්‍රෝසොෆ්ට් වර්ඩ් (Microsoft word) සහ ලිබ්රේ ඔෆිස් රයිටර් (Libre Office Writer) හි භාවිත කරනු ලබන කෙටි මං යතුරු (shortcut) සංයෝජනය කුමක් ද? (2021)
1) Ctrl + A
2) Ctrl + C
3) Ctrl + H
4) Ctrl + X

12. වදන් සැකසුම් යෙදුමක, ඔබගේ අවසන් ක්‍රියාව/ක්‍රියාවන් ලොප් (undo) කිරීමට ගන්නා කෙටිමං යතුරු සංයෝජනය කුමක් ද? (2022)
1) Ctrl + H
2) Ctrl + N
3) Ctrl + Y
4) Ctrl + Z

13. තෝරාගත් පාඨයක් වෙනස් ලැයිස්තු වර්ග දෙකකට හැරවීමට පහත කවර අයිකන යුගලය භාවිත කළ හැකි ද? (2022)

(1) 
(2) 
(3) 
(4) 

14. වදන් සැකසුම් මෘදුකාංගයක් සම්බන්ධයෙන් පහත කවරක් නිවැරදි ද? (2022)
A - ලේඛනයක ඇති වගුවක (table) ඕනෑම කෝෂ (cells) දෙකක් සංයුක්ත (merge) කළ හැකි ය.
B - ලේඛනයක වචනයක් තෝරාගැනීමට (select), මූසිකය එකවිට දෙවරක් එම වචනය මත ක්ලික් කළ හැකි ය.
C - සුරකින ලද ගොනුවක් වෙනත් නමක් යොදා සුරැකීමට "File → Save As" තෝරාගැනීම භාවිත කළ හැකි ය.

1) A සහ B පමණි
2) A සහ C පමණි
3) B සහ C පමණි
4) A, B සහ C සියල්ලම

15. වදන් සැකසුම් මෘදුකාංගයක සම්පූර්ණ ලේඛනයම තෝරා ගත හැක්කේ පහත කවර කෙටිමං යතුරු සංයෝජනයෙන් ද? (2022)
1) Ctrl + A
2) Ctrl + C
3) Ctrl + N
4) Ctrl + X

ICT Tutorials HUB